වැලිකන්ද ප්‍රාදේශීය සභාව

---------------------------------

පොළොන්නරුව දිස්ත්‍රික්කය

-----------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මාර්ග සතිය 2017 ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණු රු:1,109,091 ක කර්මාන්ත ණයහිමියෝ ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ආදායම රු: 809,601 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු: 211,572 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) උතුරුමැද පළාත් සභාව විසින් ඉදිකරදී තිබුණු ප්‍රාදේශීය සභා කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු: 52,400 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සභාව සතු වැලිකන්ද කෘෂි ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කරන ලද පිරිවැය හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(උ) ගලවා ඉවත් කරන ලද කාර්යාල රථවාහන අංගනයෙහි පිරිවැය වූ රු: 601,720 ක් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඌ) සභාවට අයත් සෙවනපිටිය සතිපොල භූමියෙහි වැසිජල බස්නා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු: 216,700 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) කාර්යාල රථ වාහන අංගනය ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල දී වැය කර තිබුණු රු. 180,000 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඒ) ජල ගබඩා ටැංකි දෙකක් තැබීමට හැකිවන පරිදි නිර්මිතය ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු. 1,459,796 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඔ) සේවක ණය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 22,645 ක ණය ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලින්අත්හැරී තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම තුල 2016 දෙසැම්බර් මාසයට අදාල උසාවි දඩ ආදායම් රු. 272,083 ක් ඇතුලත්ව තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම තුල 2016 වර්ෂයේ නොවැම්බර් මස මුද්දර ගාස්තු රු. 159,000 ක් සටහන් ව තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ට වැඩි ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු. 525,715 ක් වූ අතර එයින් රු. 476,695 ක් වර්ෂ 03 ඉක්මවා තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වියදම් ණයහිමි ශේෂ 04කට අදාලව එකතුව රු: 468,474 ක් 2005 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 232,782,136 ක් වූ ගිණුම්විෂයයන් 8 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම්

---------------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකුල නොවීම් |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| 152(1) වගන්තිය | 33,000 | සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ බදු අයකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත | | සභා බල ප්‍රදේශය තුල පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ආයතන හඳුනාගෙන බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ කල් ඉකුත් වී තිබූ පරිසර ආරක්ෂක බලපත්‍ර සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ද සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) | | |
| (i) | රීති අංක 59 සිට 63 දක්වා | - | සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | රීති 203 | | 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම සභාව විසින් භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා විගණකාධිපති වෙත යවා නොතිබුණි. |
| (iii) | රීති 212 | 3,544,414 | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු භාණ්ඩ විෂයයන් 70 ක් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මු.රෙ 104 | - | සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හා අවසන් පරීක්ෂණ වාර්තා සකස් නොතිබුණි. |
| (ii) | මු.රෙ 110 | - | වාහන අනතුරු සම්බන්ධයෙන් හානි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ 371 2(ඇ) | 202,000 | සභාවේ ලේකම් විසින් අවස්ථා 9 ක දී ලබා ගෙන තිබූ අත්තිකාරම් මුදල් මාස 05 සිට මාස 11 දක්වා කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. |
| (iv) | මු.රෙ 880 | | ඇප තැබිය යුතු නිළධාරීන්ගේ ඇප ලබා ගෙන නොතිබුණි. |
| (v) | මු.රෙ 1674(ඉ) | | වාහන භාර නිළධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ |

| | | | |
|---|---|---|---|
| | | | ඒ වාහනයේ වර්ගය, මෝස්තරය, ලියාපදිංචි කිරීමේ අංකය, තමන්ට භාරදුන් දිනය, ඒ පිළිබඳ විස්තර හා වෙනත් නිසි තොරතුරු දැක්වෙන ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>------------------------------------------ | | |
| (i) | 2.8.1 මාර්ගෝපදේශය | | සභාව විසින් තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවා නොතිබුණි. |
| (ii) | 2.11.3 මාර්ගෝපදේශය | | කමිටු රුස්වීම් වල වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියකට අනුව වාර්තා කර පැමිණ සිටින සාමාජිකයින් විසින් සහතික කළ යුතු වුවදසභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | 4.2.1 (අ) මාර්ගෝපදේශය | | සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහාප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඊ) | චක්‍රලේඛ හා ලිපි<br>2015 දෙසැම්බර් 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක එන්සිපි/එල්ජී/ඒසී/4/1/2 දරන ලිපිය | 374,775 | සභාපතිවරයා වෙත වෙන් කර ඇති නිල වාහනය 2015 දෙසැම්බර් සිට මසකට ඉන්ධන ලීටර් 150 ක උපරිමයකට යටත්ව ලේකම්වරුන්ට භාවිතා කළ හැකි වුවත් ඊට අනුකූල නොවන ලෙස ඉන්ධන භාවිතා කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ඉන්ධන ලීටර් 3,649 ක් වැඩිපුර භාවිතා කර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 770,804 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,135,860 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම හා රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 909,600 | 365,000 | 365,000 | - | 1,385,000 | 516,209 | 516,209 | - |
| (ii)කුලී | 5,667,900 | 4,495,116 | 2,823,900 | 2,562,014 | 13,034,900 | 3,749,500 | 4,669,361 | 1,999,118 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,067,500 | 326,720 | 330,450 | 651,475 | 933,750 | 200,760 | 201,260 | 654,800 |
| (iv)වෙනත් ආදායම් | 30,639,400 | 5,053,016 | 17,610,917 | 11,938,714 | 22,109,100 | 5,742,665 | 17,653,745 | 5,711,681 |
| | 38,284,400 | 10,239,852 | 21,130,267 | 15,152,203 | 37,462,750 | 10,209,134 | 23,040,575 | 8,365,599 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

2017 වර්ෂය සඳහා මුළු ඇස්තමේන්තුගත ආදායම රු. 38,284,400 ක් වූ නමුත් ඉන් බිල්කල ආදායම රු. 10,239,852 ක් වූයෙන් රු. 28,044,548 ක අධි ඇස්තමේන්තු කිරීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු. 15,152,203 ක් විය.

### 2.2.3 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කසල බදු අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, ආයතන 94 කින් අයවිය යුතු හිඟ කසල බදු ආදායම රු, 475,200 ක් විය.

### 2.2.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සෙවනපිටිය නගරයේ අතුරු බදු දී තිබූ කඩකාමර 19 කින් සභාවට ලැබීමට තිබූ හිඟ කුලිය රු. 833,247 ක් වූ නමුත් ඒ සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් බැකෝල්ලෝඩර් යන්ත්‍රය වෙනුවෙන් පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහන මගින් අයවිය යුතු රු. 52,400 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) වැලිකන්ද සතිපොල බදු දීම යටතේ, ටෙන්ඩර් මුදලින් ඉතිරි සියයට 50ක මුදල වූ රු: 805,750 ක් 2017 ජූනි 30 දිනට පෙර ටෙන්ඩර්කරු විසින් සභාවට ගෙවිය යුතු වුවත්, 2018 ජනවාරි 18 දින වන විටත් රු. 98,152 ක හිඟ මුදලක් හා ඒ මත රු. 18,801 ක දඩ මුදලක් ද අයවීමට තිබුණි.

2.2.5 වෙනත් ආදායම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බල ප්‍රදේශය තුල විවිධ ආයතන 25කින් ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් 33 කින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු: 285,612 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ආ) 2009 අප්‍රේල් 17 දින අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ (v) වන උපලේඛනයට අනුව දුරකථන කුළුණු ඉදිකිරීම වෙනුවෙන් ගාස්තු අයකල යුතු වුවත්, සභා බල ප්‍රදේශය තුල ඉදිකර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 09 කින් ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ වඩුමුනේ පාර, වඩුමුනේ මංකඩ, වැලිකන්ද යන ස්ථානවල වැලි ඇදීමේ කටයුතු සඳහා යොදාගන්නා අක්කර 2½ - 3 පමණ භූමි ප්‍රදේශයේ, දිනකට ටිපර් රථ 125 ත් 150 ත් අතර ප්‍රමාණයක් ගාල් කර තබන නමුත් රථගාල සඳහා යටිතල පහසුකම් නිසි පරිදි සපයා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ත්‍රී රෝද රථ ගාල් 06 කින් අයවිය යුතු ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු රැස්කරගෙන නොතිබුණි.

## **03. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 කාර්ය සාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියයටතේ ප්‍රධාන කාරණා13 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු බව හඳුනාගෙන තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වන විටත් එකදු අතුරු ව්‍යවස්ථාවක් හෝ පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් හඳුනාගෙන ඒ වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සභාවේ කුණු කසළ බැහැර කිරීම සඳහා 2017 වර්ෂයේ දී ලබාදී තිබුණු සේනපුර, ඇතාගල ප්‍රදේශයේ අක්කර 05 ක ඉඩම2017 ජුනි වන විට මැණුම් කටයුතු අවසන් කර තිබුණ ද ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් දෛනිකව එකතු වන කැලි කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර පොලිතීන්, ප්ලාස්ටික් හා වීදුරු ඇතුළු ඝන අපද්‍රව්‍ය වර්ග කිරීමකට හෝ ලක් නොකර වැලිකන්ද නගරයට යාබද සිංහපුර 1 කනුව ප්‍රදේශයේ පිහිටි විවෘත භූමිය පුරා අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. එම ස්ථානයේ වන අලින් බහුලවම ගැවසෙන ස්ථානයක් බවට පත් වී ඇති අතර මැසි මදුරුවන් බෝවීම, වැසි

කාලයේ දී අපද්‍රව්‍ය ජල මූලාශ්‍රවලට එකතු වීම අධික දුර්ගන්ධය හා පොලිතීන් වැනි දිරාපත් නොවන අපද්‍රව්‍ය භූමිය පුරා විසිරී පැවතීම වැනි සෞඛ්‍ය හා පාරිසරික ගැටළු රැසක් මතු වී ඇති බව 2018 ජනවාරිමස සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(iii) කැලිකසළ වෙන් කර ලබා ගැනීම, වර්ගීකරණය කිරීම, දිරාපත් වන අපද්‍රව්‍ය භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය සහ අලෙවිය පළාත් පාලන ආයතනයක් ඉටු කල යුතු අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කර තිබිය දී විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

--------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් සභාවට අදාල අරමුණු, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා අනෙකුත් සම්බන්ධිත රාජ්‍ය ආයතන මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ දී සභාව මඟින් රු. 244,303 ක් වැය කර අන්තර්බන්ධිත කොන්ක්‍රීට් ගල් 4687 ක් අල්ලා සංවර්ධනය කරන ලද 261 - සෙවනපිටිය තුලානේ පිහිටි සමෘද්ධි බැංකුව අසල සිට තැපැල් කන්තෝරුව දක්වා මාර්ගය 2017 වර්ෂයේ පිබිදෙමු පොලොන්නරුව වැඩසටහන මඟින් එහි අතුරා තිබූ කොන්ක්‍රීට් ගල් ගලවා ඉවත් කර නැවත සංවර්ධනය කර තිබුණි. එහි දී ගලවා ඉවත් කරන ලද කොන්ක්‍රීට් ගල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බල ප්‍රදේශය තුල සවිකර ඇති වීථි ලාම්පු පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන නොතිබු අතර සභාව සතු වීථි ලාම්පු සංඛ්‍යාව හා අලුත්වැඩියා කරන ලද වීථි ලාම්පු සංඛ්‍යාව තහවුරු කර ගැනීමට නොහැකි විය. ඊට අමතරව වීථි ලාම්පු අලුත්වැඩියාව සඳහා ලැබෙන ඉල්ලීම් ද ලේඛනයක ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සභාව විසින් භාවිතා කරනු ලබන රථ වාහන 3 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගබඩා භාණ්ඩ ක්‍රමානුකූලව ඇසිරීමකින් තොරව නව සභා ගොඩනැඟිල්ලට යාබද අබලන් ගොඩනැඟිල්ලක තැන තැන ගොඩගසා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දී තෘතියික මට්ටමට අයත් ලේකම් තනතුර , ද්විතියික මට්ටමට අයත් සංවර්ධන සහකාර තනතුරු 06 ක් , කළමනාකරණ සහකාර තනතුරක් තාක්ෂණ නිලධාරි තනතුරක් හා ආදායම් පරිපාලක තනතුරු 01 ක්, පුරප්පාඩුව පැවතුණි.

(ii) අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව රියදුරෙක්, මාර්ග කම්කරුවෙක්, සෞඛ්‍ය කම්කරුවෙක් හා පුස්තකාල කම්කරුවෙකු සේවයේ යොදවා ගෙන තිබුණි.

(iii) අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ආදේශක පදනම මත සෞඛ්‍ය කම්කරුවන් 03 ක් රියදුරෙකු, මුරකරුවන් 02 ක් , ජල මනු කියවන්නෙකු ද බඳවාගෙන තිබූ අතර ඉන් සේවකයින් 03 දෙනෙකු සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත අනුමැතියක් නොතිබුණි.

(iv) ආදායම් පරිපාලක තනතුරු වර්ෂ ගණනාවක සිටම පුරප්පාඩුව පවතින අතර, මෙම තනතුර සඳහා දිගින් දිගටම ප්‍රාථමික මට්ටමට අයත් සේවකයින් (කාර්යාල කාර්ය සහායක) පත්කර තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

සෙවනපිටිය නගරයේ සිට වැලිකන්ද නගරය දක්වා මඩකලපුව කොළඹ ප්‍රධාන මාර්ගය හා දුම්රිය මාර්ගය අතර වූ මාර්ග රක්ෂිතයේ හා දුම්රිය රක්ෂිතය තුල කි:මී: 8 ක් පමණ අනවසර ලෙස නිවාස 19 ක්, වෙළඳසැල් 100 කට ආසන්න ප්‍රමාණයක් හා වෙනත් ව්‍යාපාරික ස්ථාන 35 ක් ඉදිකර තිබුණ ද, සභාව විසින් මෙම අනවසර ඉදිකිරීම් පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

------------------------------------

මහජන උපයෝගිතාවයන් සඳහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ දී සභාව වෙත ලබා දී තිබුණු ගැල්වනයිස් කොඩිකණු 368 න් එවකට සිටි සභාපතිවරයා සහ මන්ත්‍රීවරුන් විසින් රැගෙන යන ලද කොඩි කනු 213 ක් ඇතුළුව රු. 283,428 ක් වටිනා කොඩි කණු 256 ක් සභාව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කරනොතිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

-------------------------------

3.6.1 නිශ්ක්‍රීයහා ඌණ උපයෝජිත වත්කම්

------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ට්‍රැක්ටර් රථ 2 ක් වර්ෂ 01 සිට වර්ෂ 3 දක්වා කාලයක සිට අක්‍රීයව පවතින අතර ඒවා නියමිත පරිදි අලුත්වැඩියා කර සභාවේ කටයුතු සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 අප්‍රේල් 17 දින හා 2009 පෙබරවාරි 24 දින උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් සභාව වෙත ලබා දී තිබුණු රු.613,500 ක් වටිනා සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටලය වර්ෂ 9 කට අධික කාලයක් උපයෝජනය නොකර දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලය මඟින් ගලවා ඉවත් කර සභාව වෙත ලබාදුන් නැවත උපයෝජනය කල හැකි නළ ළිං උපකරණ අවිධිමත් ලෙස ගබඩාවේ ගොඩගසා තිබුණි.

(ඈ) 2007 වර්ෂයේ දී පිලිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 750,000 ක් වැය කර වැලිකන්ද සතිපොළ භූමිය තුළ ඉදිකළ ගොඩනැඟිල්ල වර්ෂ 10 කටත් අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. දැනට මෙම ගොඩනැඟිල්ලේ ඉදිකරන ලද කොන්ක්‍රීට් කණු කිහිපයක් හා බිත්ති කොටස් කිහිපයක් පමණක් ඉතිරි වී තිබුණි. ගොඩනැඟිල්ල නැවත අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

3.7 දෘෂ්‍ය අක්‍රමිකතා

------------------

සෙවනපිටිය කඩකාමරවල හිඟ ආදායම් රැස් කිරීමේ දී 2015 සහ 2016 වර්ෂ වල දී රු. 460,600 කට ආසන්න මුදලක්, 2008 වර්ෂයේ සිට වැඩ බලන ආදායම් පරිපාලක ලෙස කටයුතු කල නිලධාරියා විසින් වංචා කර ඇති බවට කරුණු අනාවරණය වී තිබුණද ඒ සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.8 ප්‍රසම්පාදනය
----------------

3.8.1 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 ග්‍රාමීය මාර්ග සංවර්ධනය සතිය (පළාත් පාලන මාර්ග සතිය) ව්‍යාපෘතිය මඟින් බල ප්‍රදේශයේ මාර්ග කි:මී: 30.8 ක් බොරළු අතුරා සංවර්ධනය කිරීම සඳහා රු. 2,150,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ප්‍රතිපාදනවලින් රු. 1,114,667 ක් පමණක් වැයකර මාර්ග කි:මී: 26.52 ක් සංවර්ධනය කර තිබුණු අතර තෝරාගත් සියළුම ග්‍රාමීය මාර්ග සඳහා බොරළු යෙදීමකින් තොරව මෝටර් ග්‍රේඩර් කිරීම හා පැති කාණු සකස් කිරීම පමණක් සිදුකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කර මාසයක් ගත වීමට පෙර බොහෝ මාර්ග වල මාර්ග තලය මතුපිට පස් සේදී ගොස් වල් බිහි වී තිබුණි. මේ අනුව පළාත් මාර්ග සතිය වැඩසටහන සඳහා වෙන් කළ ප්‍රතිපාදන මඟින් අපේක්ෂිත අරමුණු සඵලදායීව ඉටු වීනොතිබුණි.

(ආ) සභා කාර්යාල ගොඩනැඟිල්ලට පානීය ජලය ලබා ගැනීම සඳහා ලීටර් 5000 ක ධාරිතාවයෙන් යුතු ජල ගබඩා ටැංකි 2ක් තැබීමට හැකිවන පරිදි රු. 1,340,313 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුතු නිර්මිතයක් ඉදි කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 වගන්තියට අනුව තරඟකාරී ලංසු කැඳවා කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට පරිපාලන කමිටු තීරණයක් මත නව සභා ගොඩනැඟිල්ලෙහි ඉදි කිරීම් කටයුතු සිදු කරනු ලැබූ කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ඍජුවම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

3.8.2 ප්‍රසම්පාදන කමිටුව
----------------------

(අ) වැඩ බලන ආදායම් පරිපාලකවරයෙකු ලෙස කටයුතු කල නිලධාරියෙකු 2015 සහ 2016 වර්ෂ වල දී මුදල් වංචා කිරීමකට සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වී තිබිය දී 2017 ජනවාරි 01 සිට 2017 පෙබරවාරි දක්වා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර තිබුණි. 2017 පෙබරවාරි 05 සිට 2017 අගෝස්තු 16 දක්වා කාර්යාල කාර්ය සහායක සේවකයකු ලෙස පත්වීම් ලැබ තිබුණු සේවකයෙකුද කමිටු සාමාජිකයෙකු ලෙස පත් කරගෙන තිබුණි. කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලේකම්වරිය හා වැඩ බලන කාර්මික සහයකවරියද ඥාතීන් විය.

**04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
**----------------------------------------**

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

සමාලෝචිත වර්ෂයේ සභාවේ ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනපරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු
---------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයන් හි විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කාලානුරූපීව රැස්වීම් පවත්වා නොතිබුණි.

**05.** **පද්ධති හා පාලන**

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| | | (ii) | වත්කම් ඌණ උපයෝජිතව පැවතීම. |
| (ආ) | ගිණුම්කරණය | | මුදල් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම යාවත්කාලීන නොවීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල උපයෝජනය | | විධිමත් බඳවා ගැනීමේ පටිපාටි අනුගමනය නොකිරීම හා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදු කිරීම. |
| (ඈ) | ආදායම් පරිපාලනය | (i) | ආදායම් ලේඛන යාවත්කාලීන ව නොපැවැත්වීම |
| | | (ii) | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |
| | | (ii) | විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම. |
| (ඊ) | ණයගැති/ ණයහිමි | | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් නොකිරීම. |
| (උ) | වාහන පාලනය | (i) | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා නොකිරීම. |
| | | (ii) | වාහන පිළිබඳ සමීක්ෂණයක් නොපැවැත්වීම. |